# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1967/62 - 2016 මැයි මස 20 වැනි සිකුරාදා - 2016.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකාවේ මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, එමගින් මද්‍යසාර පාලනය පිළිබඳ ක්‍රියාකාරකම් සිදුකිරීමට අවශ්‍ය සහාය ලැබෙනු ඇත. දීර්ඝ කාලයක සිටම ජාතික අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන තිබුණු මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමට හේතු වූයේ මද්‍යසාර භාවිතය බොහෝ රෝගී තත්ත්වයන්, අකල් මරණ හා ආබාධ තත්ත්වයන් ඇතිවීමට සැළකිය යුතු දායකත්වයක් සපයන බැවිණි.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සියලුම පාර්ශවකරුවන් සමග එක්ව මෙම ප්‍රතිපත්තිය සකස් කරන ලද අතර, එමගින් මද්‍යසාර භාවිතය අවම කිරීමට, ඒ ආශ්‍රිත රෝගී තත්ත්වයන්, මරණ සහ ආබාධිත තත්ත්වයන් අඩු කිරීමට සියලුම පාර්ශවකරුවන් සහ පළාත් අමාත්‍යාංශ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මග පෙන්වීම සිදුකරනු ලැබේ.

අනුර ජයවික්‍රම,<br>
ලේකම්,<br>
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2016 මැයි මස 20 වැනි දින,<br>
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,<br>
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,<br>
කොළඹ 10.

**ශ්‍රී ලංකාවේ මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

**2015**

1. **හැඳින්වීම**

මද්‍යසාර භාවිතය යනු ලොව පුරා මහජන සෞඛ්‍ය, සංවර්ධනය හා දිළිඳු බව දුරලීම අඩාල කරවන, මිනිසුන් රෝගී කරවන එක් ප්‍රධාන සාධකයකි. මද්‍යසාර භාවිතය නිසා පුද්ගලයින්ගේ ජීවිත හා පවුල් මෙන්ම මුළු මහත් සමාජය ම බිඳවැටීමට ලක් වේ.

මද්‍යසාර භාවිතය මිනිසුන්ට වැළඳෙන ලෙඩ රෝග රැසකට දායක වන ප්‍රධාන හේතුවකි. පහළ ආදායම් ලාභී රටවල මිනිසුන් අකල් මරණවලට හා ආබාධවලට ගොදුරුකරවන හේතුන් ලැයිස්තුවේ ඉහළින්ම පවතින්නේ ද මද්‍යසාර භාවිතය යි. එය ලෙඩ රෝග 60 ක ප්‍රධානතම හේතු සාධකය වන අතර තවත් රෝගී තත්ත්ව 200ක් සෑදීමට දායක වේ (මද්‍යසාර පිළිබඳ ගෝලීය තත්ත්ව වාර්තාව, 2004).

1A - G 23014 — 57 (2016/02)

ශ්‍රී ලංකාවේ සිරෝසිස් නිසා පුරුෂයින් මියයන අනුපාතය පුරුෂයින් 100,000 කට 37.3 කි (ගෝලීය සෞඛ්‍ය නිරීක්ෂණ දත්ත, ලෝක සෞඛ්‍ය සංවිධානය, 2012). මද්‍යසාර රටෙහි පවතින ඉහළ සියදිවි නසා ගැනීමේ ප්‍රතිශතයන්වලට ද ප්‍රබලව දායක වේ (අබේසිංහ ආර්, 2008). එය ගෘහස්ථ හිංසනයට හේතුකාරකයක් වන අතර, ශ්‍රී ලංකාවේ මද්‍යසාර හා දිළිඳු බව අතර ඉතාමත් සංකීර්ණ සම්බන්ධතාවක් ඇත (සුබ්‍රමනියම් සහ සිවයෝගන්, 2001 ; ද සිල්වා, සමරසිංහ සහ හංවැල්ල, 2011).

ශ්‍රී ලංකාවේ සිදුවන මරණ 10ක් ගත්විට එයින් 7 ක් සිදුවන්නේ බෝ නොවන රෝග නිසාවෙනි. මද්‍යසාර භාවිතය බෝනොවන රෝග ඇතිකරවන ප්‍රධාන හේතු සාධක 4 න් එකකි. දුම්කොළ සහ දුම්වැටි භාවිතය, සෞඛ්‍යයට හිතකර නොවන ආහාර රටා සහ ව්‍යායාම නොලැබීම අනෙක් හේතුකාරක වේ. ශ්‍රී ලංකාවේ වර්තමාන මද්‍යසාර භාවිතය පුරුෂයින් අතර 39.6% ක් වන අතර ස්ත්‍රීන් අතර 2.4% කි (ශ්‍රී ලංකාවේ ජාතික මද්‍යසාර භාවිතය පිළිබඳ සමීක්ෂණය, 2012). මද්‍යසාර භාවිතා කරන ප්‍රතිශතය ඉහළ යාම, රෝග නිසා ඇතිවන විවිධ බලපෑම් වලට සැලකිය යුතු දායකත්වයක් සපයන බැවින් එවැනි තත්ත්වයක් ඇතිවීම මගහරවා ගැනීමට උපරිම ප්‍රයත්නයන් දැරිය යුතුය (මද්‍යසාර පිළිබඳ ගෝලීය තත්ත්ව වාර්තාව, 2011). මද්‍යසාර භාවිතය පැතිරී ගියද ජනගහණයෙන් වැඩි ප්‍රතිශතයක් කිසිම විටක මද්‍යසාර පානය නොකිරීම සැනසිලිදායක තත්ත්වයකි.

මෙම වාතාවරණය තුළ මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය එළිදැක්වෙන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගෝලීය මද්‍යසාර පාලන ප්‍රතිපත්ති වැඩසටහන යටතේ හා වසර 2025 වනවිට ලෝකයේ බෝනොවන රෝග නිසා සිදුවන මරණ ප්‍රතිශතය 25% කින් අඩුකිරීමේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගෝලීය සැලැස්මට ශ්‍රී ලංකා රජය නිසි අවධානය දක්වීමක් ලෙස ය. මෙය 2011 වසරේ දී අතිගරු ජනාධිපතිතුමන් සහභාගී වූ බෝනොවන රෝග වැළැක්වීම හා පාලනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමේ දී බිහිවූ දේශපාලනික ප්‍රකාශනයේ ප්‍රතිඵලයකි (United Nations General Assembly Resolution - UN/A/RES/66/2).

**අනෙකුත් අදාළ ප්‍රතිපත්ති හා නීති මාලාවන්**

1. 2006, අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත
2. 1912, අංක 8 දරන සුරාබදු ආඥාපනත
3. මත්ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීම හා පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය, 2005
4. ශ්‍රී ලංකා පොලිස් ආඥාපනත (1984 සංශෝධනය)

**2. මෙහෙයුම් මූලධර්ම**

1. මද්‍යසාර භාවිතය හා ඉන් වන හානිය වැළැක්වීමේ වැඩසටහන් මහජන සුවසෙත සැලසීමේ අරමුණින් ක්‍රියාත්මක විය යුතු අතර ඒවා පවතින හොඳම විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ, හා ශ්‍රී ලාංකීය සමාජයට ගැළපෙන ඒවා විය යුතු ය.

2. ප්‍රතිපත්ති සාධාරණාත්මක විය යුතු අතර ජාති, ආගම් හා සංස්කෘතික වටිනාකම් හා ගැළපෙන ඒවා විය යුතු ය.

3. මද්‍යසාර මගින් සමාජයට, ආර්ථිකයට, සෞඛ්‍යයට හා සංවර්ධන ඉලක්ක සපුරාගැනීමට විවිධාකාරයෙන් සිදුවන හානිය හේතුවෙන්, ඒවා අනෙකුත් වෙළඳ භාණ්ඩ ගණයට ලා නොසැළකිය යුතු ය.

4. මද්‍යසාර හා බැඳී පවතින බොහොමයක් ප්‍රශ්න සෞඛ්‍ය ක්ෂේත්‍රයෙන් ඔබ්බට විහිද ගිය ඒවා බැවින් එහි හානිය වැළැක්වීම සඳහා අනෙකුත් ක්ෂේත්‍ර සම්බන්ධ කරන්නාවූ ප්‍රවේශයක් භාවිතා කළ යුතු ය.

5. තරඟකාරී ආර්ථික හා වාණිජමය වටිනාකම් අභිබවා මහජන සෞඛ්‍යය කෙරෙහි ප්‍රමුඛත්වය ලබාදිය යුතු අතර එවැනි ප්‍රවේශයන් දිරිගන්වන ක්‍රියාමාර්ග වලට සහයෝගය ලබාදිය යුතු ය.

6. මද්‍යසාර නිෂ්පාදකයින්, බෙදාහරින්නන්, අලෙවි ප්‍රවර්ධකයින්, සිල්ලර වෙළඳුන් හා මද්‍යසාර කර්මාන්තයට වක්‍රව සම්බන්ධතා ඇති කිසිදු කෙනෙකු මද්‍යසාර හා සම්බන්ධ ආර්ථික, වෙළඳ, සෞඛ්‍ය, අධ්‍යාපනික හෝ වෙනයම් ප්‍රතිපත්ති සැකසීමේ හෝ ක්‍රියාවට නැංවීමේ කිසිදු පියවරකට හෝ පාර්ශවකරුවන් කර නොගත යුතු ය.

7. මද්‍යසාර නිසා අගතියට පත් පුද්ගලයින්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට දැරිය හැකි සහ ඵලදායි රෝග නිවාරණ, රෝග සත්කාරක හා පුනරුත්ථාපන සේවාවන් ඇතුළුව ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් සඳහා ඉඩ ලැබිය යුතු ය.

8. මෙම ප්‍රතිපත්තිය මත පදනම් වූ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ක්‍රමෝපායන් මගින් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතෙහි අරමුණු බලගැන්විය යුතු අතර මද්‍යසාර භාවිතය වැළැක්වීමට හා පාලනයට ඇති නීති, ක්‍රමෝපායන් හා වැඩසටහන් ශක්තිමත් කරවිය යුතු ය.

9. වැඩසටහන් සැලසුම් කිරීමේ දී, ක්‍රියාවට නැංවීමේ දී, නියාමනය කිරීමේ දී හා ප්‍රතිඵල ඇගයීමේ දී ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමට වගබලා ගත යුතු ය.

10. මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා දේශපාලන කැපවීම තහවුරු කරගත යුතු ය.

3. දැක්ම

ශ්‍රී ලංකාව මද්‍යසාර පාලනය සඳහා වූ ක්‍රියාකාරකම්වල විශිෂ්ටත්වය ළඟා කරගැනීම.

4. අරමුණු

1. මද්‍යසාර නිෂ්පාදනය හා භාවිතය ප්‍රවර්ධනය කරනු ලබන සියලු ආකාරයේ ක්‍රියාකාරකම් වැළැක්වීම
2. මද්‍යසාර අලෙවියෙහි විවිධ පැතිකඩ හා බැඳුණු මිල නියම කිරීමේ, අලෙවි කිරීමේ හා ආයෝජන ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීම
3. මද්‍යසාර නිෂ්පාදනවල සුලභ බව හා පහසුවෙන් ලබාගත හැකි බව අඩුකිරීම
4. සියලු ජන කොටස් නිවසේ දී, රැකියා ස්ථානයේ දී හා පොදු ස්ථානවල දී මද්‍යසාර භාවිතයේ ආදීනවයන්ගෙන් ආරක්ෂා කිරීම
5. මාර්ග අනතුරු ඇතුළු මද්‍යසාර හා සම්බන්ධ සියලු ආකාරයේ අනතුරු හා තුවාල සිදුවීම් තුරන්කිරීම
6. මද්‍යසාර භාවිතය පටන් ගැන්ම හා භාවිතයට හුරුවීම වළක්වන සමාජ වටපිටාවක් සැකසීම
7. මද්‍යසාර නිසා රටෙහි සංවර්ධනයට ඇතිවන බලපෑම ද ඇතුළුව මද්‍යසාර සම්බන්ධ ගැටළු පිළිබඳ ආවේක්ෂණය හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
8. මද්‍යසාර පාලනය සඳහා සහය සපයන සේවා හා පුනරුත්ථාපන කටයුතු ප්‍රජා සහභාගිත්වය මගින් ශක්තිමත් කිරීම
9. මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට මද්‍යසාර කර්මාන්තය මගින් කෙරෙන බලපෑම් වැළැක්වීම
10. මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට සමගාමීව ක්‍රියාවට නැංවීම හා නියාමනය කිරීම

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පහත දැක්වෙන ප්‍රමුඛතා විෂයපථයන් හඳුනාගෙන ඇත.

5. ප්‍රමුඛතා ප්‍රතිපත්තිමය විෂය පථයන්

1. අලෙවිකරණය
2. මිල නියම කිරීම, වෙළඳාම හා ආයෝජනය
3. මද්‍යසාර නිෂ්පාදනවල සුලභ බව හා පහසුවෙන් ලබාගත හැකිබව
4. සියලු ජන කොටස් මද්‍යසාර භාවිතයේ ඵලවිපාක වලින් ආරක්ෂා කිරීම
5. බීමත්ව වාහන පැදවීම, මාර්ගය භාවිතා කිරීම හා යන්ත්‍ර ක්‍රියා කරවීම
6. ප්‍රජා ක්‍රියාකාරකම්
7. ආවේක්ෂණය, නියාමනය, ඇගයීම සහ පර්යේෂණ සිදුකිරීම
8. සහය සපයන සේවා හා පුනරුත්ථාපන කටයුතු සවිමත් කිරීම
9. මද්‍යසාර කර්මාන්තයේ බලපෑම් වැළැක්වීම
10. ආයතනික සැකැස්ම හා මූල්‍යමය කටයුතු

6. ප්‍රමුඛතා විෂය පථයන් සඳහා ක්‍රමෝපායන් හා ක්‍රියාන්විත අරමුණු

6.1. අලෙවිකරණය

**ක්‍රමෝපාය : ඍජුව හෝ වක්‍රාකාරව හෝ සිදුකරන සියලු ආකාරයේ ප්‍රචාරණ, ප්‍රවර්ධන හා අලෙවිකරණ කටයුතු තුරන් කිරීම.**

* මද්‍යසාර ප්‍රචාරණය හා අනුග්‍රාහක දායකත්ව පිළිබඳව දැනට ඇති ව්‍යවස්ථාව අදාළ බලධාරීන් විසින් සක්‍රීය ලෙස තදින් ක්‍රියාත්මක කළ යුතු ය.

* අන්තර්ජාලය හරහා හා සමාජ සත්කාර ව්‍යාපෘති ලෙස සිදුවන ප්‍රචාරණ, ''පුද්ගලික'' ලෙස නම් කර සංවිධාන කරනු ලබන උත්සව හා වෙනත් අවස්ථා හා අලෙවිකරණ මධ්‍යස්ථානවල සහ මද්‍යසාර සංග්‍රහ කරන අවන්හල් යනාදියෙහි සිදු කරන ප්‍රචාරණ හා අලෙවිකරණ කටයුතු පිළිබඳ නව ව්‍යවස්ථා සහ නියෝග පැනවිය යුතු ය.

* දේශීය හා විදේශීය ලෙස නිපදවන ටෙලි නාට්‍ය හා චිත්‍රපට ඇතුළු අනෙකුත් වින්දනාත්මක වැඩසටහන් හා මුද්‍රිත මාධ්‍ය හරහා සිදු කෙරෙන මද්‍යසාර පිළිබඳ සියලුම ආකාරයේ ප්‍රවර්ධන තුරන් කිරීම සඳහා නව ව්‍යවස්ථා සහ නියෝග සකස් විය යුතු ය. එහිදී කර්තෘවරුන්, සංස්කාරකවරුන්, ග්‍රන්ථ ප්‍රකාශකයින්, දේශීය වෙළඳපොළ සඳහා දෙබස් කවන්නන් ද ඇතුළුව නිෂ්පාදකයින්, අධ්‍යක්ෂකවරුන්, පරිවර්ථකයින්, අනුග්‍රාහකයින් සහ එම වැඩසටහන් ප්‍රචාරය කරන මාධ්‍ය ආයතන එම නීති කඩකිරීම්වලට වගකිවයුත්තන් විය යුතු ය.

* එවැනි අලෙවිකරණ ක්‍රම නියාමනය කිරීමට හා ඒවාට ප්‍රතිචාර දැක්වීමට විනිවිද භාවයෙන් යුතු පද්ධතියක් ද සකස්විය යුතු අතර, ඒ පිළිබඳව ලැබෙන මහජන පැමිණිලි විමසා බැලීමට හා අවශ්‍ය පරිදි ක්‍රියාත්මක කිරීමට පද්ධතියක් ද පිහිටුවිය යුතු ය.

* මද්‍යසාර අලෙවිකරණය පිළිබඳ නීති සහ නියෝග කඩවීම් වල දී විදිය යුතු දඬුවම් නිරන්තරයෙන් සමාලෝචනයට ලක්වී සංශෝධනය විය යුතු ය.

* මද්‍යසාර නිෂ්පාදනවල ලේබල හා අසුරණ වල ඒවා හානියෙන් තොර, අනෙක් නිෂ්පාදනවලට වඩා හානියෙන් අඩු හෝ සෞඛ්‍යයට හිතකර ප්‍රතිඵල ලබාදීම වැනි පාරිභෝගිකයා රවටන වදන් හෝ රූප සටහන් අඩංගු නොවීමට නීති සහ නියෝග ක්‍රියාත්මක විය යුතු ය.

**6.2. මිළ නියම කිරීම, වෙළඳාම හා ආයෝජනය**

**ක්‍රමෝපාය : රජයේ අදායමට උපරිම වාසියක් ලැබෙන අයුරින් මද්‍යසාර කර්මාන්තයේ විවිධ පැතිකඩ ආවරණය වන පරිදි මිල නියම කිරීම, අලෙවිය හා ආයෝජනය පිළිබඳ ප්‍රතිපත්ති සැකසීම මගින් මද්‍යසාර නිසා ඇතිවන හානිය තුරන් කිරීම හා මද්‍යසාර පරිභෝජනය අවම කිරීම.**

* රජයට ලැබෙන ආදායම වැඩි කිරීම හා ඊට සමගාමීව මද්‍යසාර පරිභෝජනය, ඒ නිසා ඇතිවන හානිය අවම කිරීම සඳහා මද්‍යසාර කෙරෙහි බලපැවැත්වෙන සුරාබදු හා අනෙකුත් බදු නිරන්තරයෙන් සංශෝධනය විය යුතු ය. මෙම ප්‍රවිෂ්ටය ජාත්‍යන්තර විද්‍යාත්මක පර්යේෂණ මගින් තහවුරු වී ඇත.

* මද්‍යසාර වල මිල වැඩිවීම නිසා රජයට ලැබෙන බදු ආදායමේ වැඩිවීම පිළිබඳ මහජනයා දැනුවත්වන හා ඒ පිළිබඳ දත්ත මහජනයාටද ලැබෙන පරිදි මද්‍යසාර බදුකරණ ක්‍රියාවලියේ විනිවිදභාවය වැඩි දියුණු කළ යුතුය. රජයට අයවිය යුතු බදු ගණනය කිරීමේදී නිෂ්පාදන පරිමාවන් අවතක්සේරුවකට ලක්වීම වැළැක්වීමට අවශ්‍ය සෑම පියවරක්ම යෙදිය යුතුය.

* ශ්‍රී ලංකාව තුළ සිදුවන මද්‍යසාර නිෂ්පාදනය, බෙදාහැරීම හා අලෙවිය සඳහා ආයෝජන ප්‍රවර්ධන තත්ත්වය වැනි බදු සහන ලබා නොදිය යුතුය.

* තීරුබදු රහිත මද්‍යසාර ආනයනය හා අලෙවිය නවතා දැමිය යුතුය.

* ශ්‍රී ලංකාවේ මද්‍යසාර භාවිතය හා එහි හානිය පාලනය කිරීම අඩාල කරවන ජාත්‍යන්තර, බහුපාර්ශවීය හා ද්වීපාර්ශවීය වෙළඳ ගිවිසුම්වල ඇති අන්තර වාක්‍ය හෝ වගන්තිවලට රජය එකඟ නොවිය යුතු අතර එවැනි ගිවිසුම් ඇතිකර ගැනීමේ දී මද්‍යසාර නිසා මහජන සෞඛ්‍යයට සිදුවන හානිය පිළිබඳ සැලකිය යුතු අවධානයක් යොමුකළ යුතුය.

* විවිධ කර්මාන්ත සඳහා ස්ප්‍රීතු වර්ග වැනි මද්‍යසාර නිපදවීම සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය ආනයනය කිරීම දැඩි ලෙස පාලනය කළයුතු අතර එවැනි ආනයනික රසායන ද්‍රව්‍ය අදාළ නිෂ්පාදන කර්මාන්තය සඳහා පමණක් යොදා ගන්නා බවට තහවුරු කිරීම සඳහා අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතු ය.

**6.3. මද්‍යසාර නිෂ්පාදනවල සුලභ බව හා පහසුවෙන් ලබාගත හැකිබව**

**ක්‍රමෝපාය 1 : මද්‍යසාර නිසා ඇතිවන සියලු ආකාරයන්හි හානි තුරන්කිරීම හා මද්‍යසාරවලින් නිදහස්වූ සමාජයක් ඇති කිරීමේ ඉලක්කය සපුරාගැනීම සඳහා සමායෝජිත හා දිගුකල් පවතින ක්‍රියාමාර්ග ගැනීම මගින් මද්‍යසාර නිෂ්පාදනවල සුලභ බව හා පහසුවෙන් ලබාගත හැකි බව පාලනය කිරීම.**

* ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන සියලුම මද්‍යසාර නිෂ්පාදනවල අඩංගුවිය හැකි ශුද්ධ මද්‍යසාර ප්‍රමාණය තීරණය කර එය ඉදිරි වසර දහය තුළ ක්‍රමක්‍රමයෙන් අඩුකිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවිය යුතු ය.

* මහජන සෞඛ්‍ය කෙරෙහි ඇති හිතකර බව, ආර්ථික වාසි හා එරෙහිවන සාධක යන අංශ ගැන අවධානය යොමු කර මද්‍යසාර නිෂ්පාදනය හා අලෙවිය ක්‍රමිකව අඩුකළ හැකි මධ්‍ය හා දිගුකාලීන ක්‍රියාමාර්ගයන් පිළිබඳව අධ්‍යයනය කළ යුතු ය.

* දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට අනුකූලව වයස අවුරුදු 21 ට අඩු පුද්ගලයින් විසින් සියලුම වර්ගවල මද්‍යසාර නිෂ්පාදන ලබාගැනීම වැළැක්වීම සඳහා යෝග්‍යවූ ව්‍යවස්ථාදායක, විධායක, පරිපාලන හා වෙනත් ක්‍රමවේද තිබිය යුතු ය.

* ''සංචාරක කටයුතු'' කෙරෙහි ලබා දෙන බලපත්‍ර ක්‍රමය යොදාගැනීමෙන් ජනගහණ ඝනත්වය හා මහජන මතය වැනි සාධක මත පදනම්ව පනවා ඇති මද්‍යසාර බලපත්‍ර ලබාගැනීමේ පටිපාටියේ ඇති බාධක මගහරවා ගැනීමට ඉඩ නොදිය යුතු ය.

* මද්‍යසාර මිලදීගැනීමේ දී මිල සහන සැලසීම තහනම් කළ යුතු ය (උද : ඇතුල්වීමේ අවසර පතක් මිලදීගත් විට මද්‍යසාර මිලෙන් කොටසක් ගෙවීම).

* සියලුම මද්‍යසාර නිෂ්පාදන වර්ග අලෙවි කිරීම සඳහා බලපත්‍ර ලබා දීමේදී මහජනයාගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා මහජන මතය වැනි සාධක මත පදනම් වූ විනිවිදභාවයෙන් යුත් නව ක්‍රමවේදයක් සකස් කළ යුතු ය.

* තාවකාලික මද්‍යසාර අලෙවිකරණ බලපත්‍ර ලබාදීම නවතා දැමිය යුතු ය.

* දරුවන් ද සහභාගී වන මහජනතාව රැස්වන අවස්ථාවල දී (උදා : ක්‍රීඩා තරඟ) මද්‍යසාර නිෂ්පාදන අලෙවිය තහනම් කළ යුතු ය.

* ''ඇල්කො පොප්ස්'' ලෙස හැඳින්වෙන මද්‍යසාර නිෂ්පාදන (පළතුරු හෝ වෙනයම් රසයන් ඇති නමුත් මද්‍යසාර සැළකිය යුතු ප්‍රතිශතයක් අඩංගුවන පානයන්) ආනයනය, නිෂ්පාදනය, අලෙවිකරණය හා අලෙවිය තහනම් කළ යුතු ය.

**ක්‍රමෝපාය 2 : දේශපාලන බලපෑම් හෝ වෙනත් සළකා බැලීම් වලින් තොරව, අඛණ්ඩව ක්‍රියාත්මක වන දැඩි නීති ක්‍රියාත්මක කිරීම් හා ප්‍රජා මැදිහත්වීම් මගින් නීතිවිරෝධී මද්‍යසාර නිෂ්පාදනය හා අලෙවිය තුරන් කළ යුතු ය.**

* සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහාම නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවලින් බැහැරවූ, දත්ත රැස්කිරීමේ හා ඇගයීමේ යාන්ත්‍රණයක් ආරම්භ කළ යුතුය.

* නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන හා අනෙකුත් රජයේ ආයතන අතර සහයෝගීතාව හා තොරතුරු හුවමාරුව ප්‍රවර්ධනය වන ලෙස දිස්ත්‍රික්ක මට්ටමින් සමායෝජනය වූ නීතිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවිය යුතු ය.

* නීති විරෝධී මද්‍යසාර නිෂ්පාදනය, ප්‍රවාහනය හා අලෙවිය වැළක්වීම සඳහාවූ දණ්ඩනීය ක්‍රියාමාර්ග වැඩිකළ යුතු ය.

* නීති විරෝධී මද්‍යසාර තුරන් කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතනවල ඵලදායිතාව මැනීම සඳහා පැවරු නඩු ගණන වෙනුවට නීතිවිරෝධී මද්‍යසාරවල සුලබභාවය භාවිතා කළ යුතු ය.

* නීති ක්‍රියාත්මක කිරීමට බාධාවීම වැළැක්වීම සඳහා රාජ්‍ය තන්ත්‍රයේ සියලු තලවල සහයෝගය ලබා දිය යුතු ය.

* නීතිවිරෝධී මද්‍යසාර නිපදවීම, බෙදාහැරීම හා අලෙවිය තුරන් කිරීම සඳහා ප්‍රජා නායකත්වය සපයන ප්‍රාදේශීය ආගමික නායකයින් ද ඇතුළුව අනෙකුත් ප්‍රජා සේවකයින්ට නිසි ආරක්ෂාව සැපයිය යුතු ය.

**6.4. සියලු ජන කොටස් මද්‍යසාර භාවිතයේ ඵලවිපාක වලින් ආරක්ෂා කිරීම**

**ක්‍රමෝපාය : මද්‍යසාර භාවිතා කරන හා නොකරන සියල්ලන් පොදු ස්ථානවල දී, සේවා ස්ථානවල දී හා නිවෙස්වල දී, මද්‍යසාර භාවිතයේ අහිතකර ඵලවිපාක වලින් ආරක්ෂා කිරීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම.**

* හිංසනය (ගෘහස්ථ හිංසනය ද ඇතුළුව) හා අනතුරු වැනි මද්‍යසාර භාවිතයේ අහිතකර ප්‍රතිවිපාක අවම කිරීම සඳහා ගත හැකි සියලු නීතිමය, නියාමන හා පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කර ඒවා දැඩිව ක්‍රියාවට නැංවිය යුතු ය.

* පොදු ස්ථානවල දී මද්‍යසාර භාවිතය නීතිය මගින් තහනම් කළ යුතු ය.

* මද්‍යසාර භාවිතය සහ හිංසනය, (ගෘහස්ථ හිංසනය ද ඇතුළුව) ළමා අපචාර හා සියදිවි නසාගැනීම් අතර ප්‍රබල සම්බන්ධතාවයක් ඇති බැවින් ඒවා වැළැක්වීම සඳහා කරන සියලු ප්‍රතිපත්ති හා වැඩසටහන් වල මද්‍යසාර භාවිතය නැවැත්වීම සහ පාලනය කිරීම පිළිබඳවද නිසි අවධානයක් යොමු කළ යුතුය.

* සෞඛ්‍ය අංශයට අයත් නොවන අනෙකුත් පාර්ශව (උදා: සමාජ සේවා, සමාජ හා තරුණ සේවා, කාන්තා ආරක්ෂණ හා ළමා ආරක්ෂණ සේවාවන්ට අයත් ක්ෂේත්‍ර නිලධාරීන්) විසින් තමාටම හෝ අනුන්ට හානියක් කිරීමට පෙළඹිය හැකි මද්‍යසාර භාවිතා කරන්නන් හඳුනාගෙන ඔවුන්ව නිසි ප්‍රතිකාර සඳහා යොමු කළ යුතු ය.

* මහජන හා රාජ්‍ය උත්සවවල හා මහජන මුදලින් සංවිධානය වන අනෙකුත් අවස්ථාවල (ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සංග්‍රහ වියදම් දීමනාව ද ඇතුළුව) මද්‍යසාර වලින් සංග්‍රහ කිරීම නැවැත් විය යුතු ය.

* දැඩිව ක්‍රියාත්මක වන දණ්ඩණ ක්‍රියාමාර්ග මගින් පොදු ස්ථානවල හා සේවා ස්ථානවල මද්‍යසාර භාවිතයෙන් පසු සිදුකරන නොහික්මුණු හැසිරීම් වැළැක්විය යුතු ය.

* මද්‍යසාර සංග්‍රහ කරන ආයතනවල දී අධික ලෙස මද්‍යසාර පානය කරන විට එය එම ආයතනවල සේවා යෝජකයින් හා සේවකයින් විසින් හඳුනාගත යුතු අතර එලෙස මද්‍යසාර පානය කිරීමෙන් දුර්වලව සිටින අයට මද්‍යසාර ලබාදීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල වලට ඔවුන් වගකිව යුතු ය.

**6.5. බීමත්ව රිය පැදවීම, මාර්ගය භාවිතා කිරීම හා යන්ත්‍ර ක්‍රියා කරවීම**

**ක්‍රමෝපාය : මද්‍යසාර භාවිතයෙන් පසු රිය පැදවීම, මාර්ගය භාවිතා කිරීම හා යන්ත්‍ර ක්‍රියාකරවීම වැළැක්වීම.**

* රුධිරයේ මද්‍යසාර සාන්ද්‍රණය අවසරලත් ප්‍රමාණයට වඩා වැඩි කිසි කෙනෙකුට වාහනයක් පැදවීමට ඉඩ නොදිය යුතු ය.

* අනිවාර්ය නිරන්තර පිරික්සීම් ඇතුළුව, මද්‍යසාර භාවිතය නිසා දුර්වල තත්ත්වයක සිට රිය පදවන්නන් හඳුනා ගැනීමට පොලිස් නිලධාරීන්ගේ හැකියාව දියුණු කළ යුතු ය.

* අවසරලත් ප්‍රමාණයට වඩා වැඩි රුධිර මද්‍යසාර සාන්ද්‍රණයක් සහිතව රිය පැදවීම සඳහා දඬුවම් හා මද්‍යසාර සම්බන්ධ අනතුරුවල ගොදුරු බවට පත්වන්නන් සඳහා ලැබෙන වන්දි විධිමත්ව වැඩි කළ යුතු ය.

* අනතුරු වලින් රෝහල්ගත වන සියලු දෙනාගේ රුධිර මද්‍යසාර සාන්ද්‍රණය පරීක්ෂා කරබැලීමේ හැකියාව හා එහි ප්‍රතිලාභ විමසා බැලීමට පියවර ගතයුතු ය.

* මද්‍යසාර භාවිතයෙන් පසු යන්ත්‍ර ක්‍රියාකරවීමට කිසිකෙනෙකුට ඉඩ නොදිය යුතු ය.

**6.6. ප්‍රජා ක්‍රියාකාරකම්**

**ක්‍රමෝපාය : මද්‍යසාර භාවිතය සඳහා ව්‍යාජ අලංකාරයක් නොදීමට වගබලා ගනිමින්, ප්‍රජාවේ සියලු කොටස් මතින් නිදහස් සමාජයක් උදා කරගැනීමට ක්‍රියාකාරී කොටස්කරුවන් කරගැනීම.**

* මද්‍යසාර භාවිතයේ පෙනෙන, නොපෙනෙන හානි, යහපැවැත්ම නැති වී යාම, හානිය තුරන් කිරීමට භාවිතා කළහැකි ක්‍රමවේද සහ නිපදවීම, බෙදාහැරීම, අලෙවිකරණය, තොග හා සිල්ලර වෙළඳාම වැනි මද්‍යසාර සම්බන්ධ විවිධ පැතිකඩ ගැන මහජනයාගේ දැනුවත්බව වැඩිකළ යුතු ය.

* මද්‍යසාර භාවිතය ප්‍රවර්ධනය කරන අයුරු හා මද්‍යසාර භාවිතයට පෙළඹවීම, පුරුද්දක් ලෙස පවත්වාගෙන යාම හා මද්‍යසාර පාලනයට එරෙහිවීම කෙරෙහි බලපාන සාධක ගැන සියලු ජන කොටස් දැනුවත් කළ යුතු ය.

* මද්‍යසාර භාවිතයට පෙළඹවීමට හා ඉන් පසු නොනවත්වා භාවිතා කිරීමට ඇති බලපෑම් හඳුනාගෙන ඒවාට ප්‍රතිරෝධ දක්වන ආකාර පිළිබඳව ළමුන්, තරුණ වැඩිහිටියන් හා මද්‍යසාර භාවිතා කරන්නන් පුහුණු කළ යුතු ය.

* මද්‍යසාර සම්බන්ධ නීති සහ රෙගුලාසි කඩවීම් පිළිබඳව පරීක්ෂාකාරීව සිටිමින් ඒ පිළිබඳව වාර්තා කිරීමට මහජනයා දිරිගැන්විය යුතු අතර ඒ සඳහා ඵලදයී යාන්ත්‍රණයක් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය යටතේ ස්ථාපිත කළ යුතු ය.

* රජය සතු බිම් මට්ටමේ නිලධාරී ජාලය හරහා මද්‍යසාර භාවිතය හා හානිය සඳහා තුඩුදෙන සාධක නිරාවරණය කර ඒවාට එරෙහිවීමට ප්‍රජාව දිරිගැන්විය යුතු ය.

* මද්‍යසාර භාවිතයෙන් පසු සිදුකරන සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා මද්‍යසාර භාවිතයෙන් පසු පෙන්වන හැසිරීම් රටාව පිළිබඳ මිත්‍යාවන් සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කළ යුතු ය.

* විවාහ මංගලෝත්සව, අවමංගල්‍ය හා අනෙකුත් සමාජ අවස්ථාවල මද්‍යසාර භාවිතයේ වැඩිවීම අවම කිරීමට හා එම වැඩිවීමේ නැඹුරුතාවට විරුද්ධවීමට ප්‍රාථමික සෞඛ්‍ය සේවා ජාලය ඇතුළු රජය සතු සියලු බිම් මට්ටම් සේවා ජාල යොදා ගතයුතුය.

* මද්‍යසාර භාවිතා කරන සියලු දෙනාම භාවිතය නැවැත්වීම සඳහා නොකඩවා දිරිමත් කළ යුතු ය.

* මද්‍යසාර වලින් නිදහස්වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රාදේශීය ප්‍රතිපත්ති හා ප්‍රජා ක්‍රියාකාරකම් සැකසීමට, සමායෝජනය හා ක්‍රියාවට නැංවීමට අවශ්‍ය වන ප්‍රාදේශීය බලධරයන්ගේ හැකියාවන් දියුණු කළ යුතු ය.

* මද්‍යසාර වලින් සිදුවන හානිය පිළිබඳව ප්‍රජාවන් දැනුවත් කිරීම සඳහා මද්‍යසාර ආශ්‍රිත ප්‍රශ්න ඇති පවුල් වල නියෝජනයෙන් පවුල් සමාජ පිහිටු විය යුතු ය.

**6.7. ආවේක්ෂණය, අධීක්ෂණය, ඇගයීම සහ පර්යේෂණ**

**ක්‍රමෝපාය : මතින් නිදහස් සමාජයක් ගොඩනැගීමට පිටුවහලක් ලබාදෙන ආවේක්ෂණය, අධීක්ෂණය, ඇගයීම සහ පර්යේෂණ සඳහා වූ පද්ධතියක් ක්‍රියාවට නැංවීම.**

* විවිධ මද්‍යසාර නිෂ්පාදනවල සත්‍ය මිල ගණන් හා ඒවා මිලදීගැනීමේ හැකියාව නිරතුරුව අධීක්ෂණය කර ප්‍රසිද්ධියට පත්කරනා ක්‍රමවේද සකස් විය යුතු ය.

* නොයෙක් රාජ්‍ය ආයතන මගින් එක්රැස් කරනා විවිධ මද්‍යසාර පිළිබඳ දත්ත එනම්, විවිධ නිෂ්පාදනවල නිෂ්පාදන පරිමාව, ආනයන, අපනයන හා එයින් ලැබෙන ආදායම වැනිදේ ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර ඒ ගැන පර්යේෂණ සිදු කරන්නන් හට එම දත්ත ලබාගත හැකි විය යුතු ය.

* මද්‍යසාර භාවිතයේ හානිකර ප්‍රතිඵල (උදා : මද්‍යසාර ආශ්‍රිත අනතුරු, හිංසන ක්‍රියා, සිරෝසීස් රෝග තත්ත්වය, සියදිවි නසාගැනීම් හා තැත්කිරීම්) අධීක්ෂණය කිරීමට හා නිරතුරුව වාර්තා කිරීමට ක්‍රමවේදයක් සකස් විය යුතු ය.

* රටේ ආර්ථිකයට සිදුවන ශුද්ධ බලපෑම දැනගැනීම සඳහා මද්‍යසාර භාවිතයේ ආර්ථිකය පිළිබඳව අපක්ෂපාතී පර්යේෂණ ප්‍රමුඛතාවයක් ලෙසට දියත් කළ යුතු ය.

* මද්‍යසාර සම්බන්ධ පර්යේෂණවල නිරතවීම සඳහා විශ්වවිද්‍යාලවල හා රජයේ පර්යේෂණ හා සමීක්ෂණ ආයතනවල ධාරිතාව දියුණු කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

* ගෝලීය වෙළඳ හා අනෙකුත් ගිවිසුම්වලින් මෙම ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කිරීමට වන බලපෑම් නිරතුරුව අධීක්ෂණයට ලක් කළ යුතු ය.

**6.8. සහය සපයන සේවා හා පුනරුත්ථාපන කටයුතු සවිමත් කිරීම**

**ක්‍රමෝපාය : මද්‍යසාර පාලනය, භාවිතය වැළැක්වීම හා පුද්ගල, පවුල්, ප්‍රජා හා ජාතික මට්ටම්වලින් සිදුවන හානිය වැළැක්වීම හා මද්‍යසාර පාලනය සඳහා විවිධ අංශ හා ප්‍රජාවන් ඒකරාශී කිරීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රය මගින් නායකත්වය සැපයීම**

* මද්‍යසාර භාවිතය ආරම්භ කිරීම වැළැක්වීමට හා ප්‍රජාව තුළ මද්‍යසාර භාවිතය හා බැඳුණු යටිතල සාධක ඇමතීමට ද, මද්‍යසාර නිසා අගතියට පත්විය හැකි හා මද්‍යසාර භාවිතයට ඇබ්බැහිවීම් හා ඒ හා සම්බන්ධ වෙනත් ගැටළු ඇති පුද්ගලයන් හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම හෝ ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා ජාලයේ හැකියාවන් වැඩි දියුණු කළ යුතු ය.

* මද්‍යසාර භාවිතා කරන්නන් සඳහා දැනට පවතින රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලික සේවාවන් සමාලෝචනයට ලක්කර, එම සේවාවන් සඳහා වර්තමානයේ ඇති ඉල්ලුමට සාපේක්ෂව, සියලුම තලවල ඇති සේවාවන්ගේ ගුණාත්මක බව, ලබා ගැනීමේ පහසුව, ලබා ගැනීමේ මූල්‍යමය හැකියාව හා ඒවාට ළඟාවීමේ හැකියාව යන අංශ වැඩි දියුණු කළ යුතු ය.

* මද්‍යසාර භාවිතා කරන්නන් සඳහා ආරම්භයේදීම කරන මැදිහත්වීම්වලට සහයෝගය ලබාදෙන වැඩසටහන් ප්‍රාථමික සෞඛ්‍ය සේවා ස්ථානවල හා අනෙකුත් සමාජ ජාලවල ආරම්භ කළ යුතු ය.

* මද්‍යසාර භාවිතා කරන්නන් අතර සිටින ක්ෂය රෝගය, සමාජ රෝග හා මානසික රෝග වැනි රෝගී තත්ත්ව වැළඳුණු අය හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය සේවා සමායෝජනය කිරීමට පද්ධතියක් ආරම්භ කළ යුතු ය.

* මද්‍යසාර පුනරුත්ථාපන මධ්‍යස්ථාන දිවයින පුරා ස්ථාපිත කර මද්‍යසාර හා ඒ ආශ්‍රිත මිශ්‍ර ගැටළු පිළිබඳ සමාජ - පාරිසරික ප්‍රවේශය පදනම් කරගත් සාර්ථක හා ආර්ථික ලෙස ඵලදායී ක්‍රමවේදයක් දිවයින පුරා ක්‍රියාත්මක කළ යුතු ය.

**6.9. මද්‍යසාර කර්මාන්තයේ බලපෑම් වැළැක්වීම**

**ක්‍රමෝපාය : රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන් හි, මද්‍යසාර සම්බන්ධ ප්‍රතිපත්ති, ව්‍යවස්ථා හා වැඩසටහන් සම්පාදනයේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී දැනට මද්‍යසාර කර්මාන්තයෙන් පවතින බලපෑම් වළක්වාලීම හා ඒවාට විරුද්ධව ක්‍රියාකිරීම.**

* පරිපාලන නියෝග මගින්, රජයේ නිලධාරින් මද්‍යසාර කර්මාන්තකරුවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම රජයේ තීරණ දැනුම්දීමට හා ඔවුන්ගෙන් අදාළ දත්ත ලබාගැනීමට පමණක් සීමාකිරීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.

* ඉහත සඳහන් අවසර ලබාදුන් අන්තර් ක්‍රියාවලදී විනිවිද බව තහවුරු කළ යුතු ය.

* රජයේ නිලධාරීන් හා රාජ්‍ය නොවන අංශවල මද්‍යසාර කර්මාන්තය සම්බන්ධව එකිනෙකට පරස්පර විරෝධී ලැදිකම් ගොඩනැගීම වැළැක්වීම සඳහා ව්‍යුහයක් සකස් විය යුතු ය.

* මද්‍යසාර කර්මාන්තය හෝ එහි පෙරමුණු සංවිධාන සමඟ සෘජු හෝ වක්‍ර ආකාරයෙන් සම්බන්ධතා පවත්වන හෝ පැවැත්වූ පර්යේෂකයින් හෝ අරමුදල් සපයන්නන් මෙම ප්‍රතිපත්තිය හා බැඳුණු ක්‍රියාමාර්ග වලට සම්බන්ධකර නොගැනීමට සියලු පියවර ගත යුතු ය.

* විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වලට බලපෑම් කිරීමට ඉඩ සලසන මද්‍යසාර කර්මාන්තයේ සියලු සමාජ සත්කාර ව්‍යාපෘති ක්‍රමයෙන් නවතා දැමීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය.

* මහජන සෞඛ්‍ය, පොදු දේපළ, අධ්‍යාපන, වෙළඳ, යෞවන, ක්‍රීඩා හා අනෙකුත් රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී මද්‍යසාර කර්මාන්තයේ අනුග්‍රාහකත්වය හා සහය ලබාගැනීම වැළැක්වීමට සියලු පියවර ගත යුතු ය.

**6.10. ආයතනික සැකැස්ම හා මූල්‍යමය කටයුතු**

***ක්‍රමෝපාය : අදාළ අනෙකුත් පාර්ශවයන්ගේ සක්‍රීය සහභාගිත්වය ඇතිව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම හා අධීක්ෂණය කිරීම.***

* සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී නායකත්වය සැපයිය යුතු අතර ඒ සම්බන්ධ අදාළ අනෙකුත් සියලු පාර්ශවවලින් සක්‍රීය සහයෝගය ලබාගත යුතුය. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එම පාර්ශවයන් සමඟ එක්ව මෙම ප්‍රතිපත්තිය මත පදනම්ව, ඒ ඒ පාර්ශවයේ වගකීම් පැහැදිලිව සඳහන් කරන ලද, කාල රාමුවකට යටත්වූ බහු පාර්ශවීය ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු ය.

* මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ නීත්‍යානුකූල වගකීම බැවින් ඒ සඳහා එම අධිකාරිය ශක්තිමත් කළ යුතු ය.

* මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කර කලින් කල ප්‍රගතිය වාර්තා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් බහු පාර්ශවීය උපදේශක කමිටුවක් පත්කළ යුතු ය.

* මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීමේ දිගුකාලීන යාන්ත්‍රණයක් රජය විසින් පිහිටුවිය යුතු ය.

**7. සම්බන්ධීකරණ යාන්ත්‍රණය**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ගේ මගපෙන්වීම යටතේ මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ කේන්ද්‍රගත ව්‍යුහය විය යුතුය. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සැලසුම් හා සම්බන්ධීකරණ ඒකකය හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වෛද්‍ය නිළධාරි/මානසික සෞඛ්‍ය (කේන්ද්‍රගත), පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ඇත.

විවිධ රාජ්‍ය ආයතනවල දායකත්වය හා සහයෝගය ඵලදායී මද්‍යසාර ප්‍රතිපත්ති සැකසීමේ දී අවශ්‍ය වේ. සෞඛ්‍ය, කම්කරු, පොලිස්, අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණික හා බදු පිළිබඳ අමාත්‍යාංශ හා ආයතනවල සහභාගීත්වය මෙහිදී වැදගත් වේ.

**8. අධීක්ෂණය හා ඇගයීම**

මෙම ප්‍රතිපත්තිය සමග විශේෂිත ක්‍රියාකාරී සැලැස්මක් හා ඵලදායී හා දිගුකල් පවතින ක්‍රියාවට නැංවීමේ හා ඇගයීමේ යාන්ත්‍රණයක් එක්ව තිබිය යුතුය. මද්‍යසාර පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සැලසුම් කරන අවධියේ ම අරමුණු හා ඉලක්ක ස්ථාපනය කිරීමත්, ක්‍රියාකාරී සැලැස්මක් තිබීමත්, ප්‍රතිපත්තියේ ප්‍රතිඵල අධීක්ෂණය කිරීමට ඉඩ සලසනු ඇත. ප්‍රතිපත්තියේ සඳහන් ක්‍රියාවන් දිස්ත්‍රික් හා පළාත් මට්ටමෙන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මෙහෙයුම් නිර්ණායක සකස්කිරීම, අධීක්ෂණය හා ඇගයීම, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ ද උපදෙස් ලබාගෙන සිදුකිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂගේ වගකීම වේ. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සැලසුම් හා සම්බන්ධීකරණ ඒකකය හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වෛද්‍ය නිළධාරී/මානසික සෞඛ්‍ය (කේන්ද්‍රගත), අනිකුත් පාර්ශවකරුවන් සමග එක්ව පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් අධීක්ෂණය හා ඇගයීම් කටයුතු සිදු කරනු ඇත.

**9. ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීම පහසුකිරීමේ හා දිගුකල් පැවතීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම**

* අදාළ දත්ත රැස්කිරීමට හා විශ්ලේෂණය කිරීමට අවශ්‍ය ක්‍රමවේද පද්ධති ලබාදීම
* ජාතික මද්‍යසාර සමුළුව අඛණ්ඩ අංගයක් ලෙස පැවැත්වීම
* පර්යේෂණ ප්‍රතිඵල වාර්ෂික වාර්තාව මගින් ප්‍රසිද්ධියට පත්කිරීම - ජනතාවට හා මාධ්‍යවලට තොරතුරු සැපයීම

**10. මෙම ප්‍රතිපත්තිය සඳහා ජාතික මානසික සෞඛ්‍ය කමිටුවේ අනු කමිටුව**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය ඒකකය මෙම අනු කමිටුව සම්බන්ධීකරණය කරන අතර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් එහි රැස්වීම්වල මුලසුන හොබවනු ඇත. කමිටුවේ සාමාජිකයින් පහත ආයතන හා සංවිධාන නියෝජනය කරනු ඇත.

1. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
2. කම්කරු අමාත්‍යාංශය
3. අධ්‍යාපන අමාත්‍යාංශය
4. ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, යෞවන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
5. අධිකරණ අමාත්‍යාංශය
6. සමාජ සේවා අමාත්‍යාංශය
7. කාන්තා කටයුතු අමාත්‍යාංශය
8. සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය
9. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
10. පොලිස් දෙපාර්තමේන්තුව
11. සුරාබදු දෙපාර්තමේන්තුව
12. මනෝ වෛද්‍ය, ප්‍රජා වෛද්‍ය හා කායික වෛද්‍ය විශේෂඥ විද්‍යායතන
13. පොදුජන සමිති සංවිධාන
14. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

06 - 786

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.